# සංකල්ප පත්‍රිකාව - (මව්බස රචනා - සිංහල)

## තාර්කිතය (Rational)

පාසල් දරුවන්ගේ භාෂා හැකියාව හා සන්නිවේදන නිපුණතාව ප්‍රමාණිකව දුර්වල වීමට හේතුවකි, ඔවුන්ගේ ලිවීම, පන්ති කාමර අභ්‍යාස වලට පමණක් සීමා වීම.

ඒ අනුව 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා දරුවන් ලිවීම සඳහා හුරු කිරීමට සතියකට එක් මාතෘකාවක් බැගින් ලබාදී ව්‍යූහගත රචනා, ප්‍රමිති පාදකව ලිවීම සඳහා හුරු කිරීම මඟින් භාෂා හා සන්නිවේදන නිපුණතා ප්‍රවර්ධනය මෙම ව්‍යාපෘතියෙහි ඉලක්කයයි.

# අරමුණු

I. පාසල් දරුවන්ගේ ලිවීමේ කලාව හා හැකියා ක්‍රමිකව සංවර්ධනයට ආකර්ශණීය මාතෘකා යටතේ රචනා ලිවීමට හුරු කිරීම.

II. එමඟින් ක්‍රමිකව භාෂා හා සන්නිවේදන නිපුණතා ප්‍රවර්ධනය

III. “භාෂාව සංවර්ධනය”, බුද්ධිය හා අනෙකුත් අධ්‍යාපන කටයුතු සඳහා ප්‍රබල ලෙස ඉවහල් වන බැවින් ඒ සඳහා පාදක කර ගැනීම.

IV. පන්ති හා ශ්‍රේණි අනුව උචිත මාතෘකා ලබාදීම මඟින් ගවේශණය, චින්තනය, හා නිර්මාණශීලිත්වය වැනි ඉහළ බුද්ධිමය දක්ෂතා අත්පත්කරගැනීමට අවස්ථාවක් ලබාදීම හා පෙළඹවීමක් ඇති කිරීම.

# ක්‍රමවේදය

I. “මව්බස” විෂය අධ්‍යක්ෂවරු හා ගුරු උපදේශකවරු සමඟ සාකච්ඡා කිරීම.
II. එක් එක් ශ්‍රේණියට අදාළ හා උචිත මාතෘකා සපයා ගැනීම.
III. එම මාතෘකා මත රචනා ලිවීම සඳහා උචිත ප්‍රමිති හා නිර්ණායක සැකසීම.
IV. රචනාව ලිවිය යුතු උචිත වචන ගණන හා ව්‍යුහය ලබාදීම.
V. රචනාව ඇගයීමට හා ගුරුවරයාට අවශ්‍ය උපදෙස් සැකසීම හා ලබාදීම.
VI. එය කුඩා පොත් පිංචයන් ලෙස නිර්මාණය කිරීම.
VII. එම පොත පාසල් වෙත බෙදා හැරීම හා භාවිතය දිරි ගැන්වීම.
VIII. කාර්යය අඛණ්ඩව ප්‍රවර්ධනය සඳහා විදුහල්පතිවරු මඟින් ගුරුවරු හා සිසුන් උපස්ථම්භනය

# ලබා ඇති ප්‍රගතිය

I. සෑම පාසලකම අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.
II. අ.පො.ස (සා/පෙළ) මව්බස විෂය සමත් සංඛ්‍යාව 91.60% දක්වා ඉහළ යාම.
III. අ.පො.ස. (සා/පෙළ) මව්බස සඳහා සම්මාන සාමාර්ථ ප්‍රමාණය 73.41 දක්වා වර්ධනය වීම.
IV. සිංහල, දෙමල, ඉංග්‍රීසි හා වෙනත් භාෂා ද ඇතුළත්ව සංස්කරණය සඳහා සහ Online ක්‍රමයට ලබාදීම සඳහා සූදානම් කිරීම.